# ශ්‍රී ලංකා සමාජයේ අභිචාර භාවිතයන්ගේ නව ප්‍රවණතා පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්.

ඉන්දිකා රාජපක්ෂ[1]

මෙම පර්යේෂණයේ ප්‍රධාන අවධානය යොමුවන්නේ ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල අභිචාර ක්‍රම භාවිතාවන්ගේ නව ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මානව ශිෂ්ඨාචාරයේ ආරම්භක අවධියේ පටන්ම මිනිසා සතු වූ මානව හැසිරීමක් වශයෙන් අභිචාර ක්‍රම හඳුනාගත හැකිය. ප්‍රාථමික සමාජයේ ජනයා තමන්ට මුහුණ දීමට සිදු වූ භෞතික සහ අභෞතික සංසිද්ධීන්වල හේතුඵල සම්බන්ධතාව තේරුම් ගැනීමට අවට පරිසරයේ සිදු වූ ඇතැම් දෑ අවබෝධ කර ගැනීමේදි ඒවා තුළ කිසියම් අද්භූත බලවේගයක් ඇති බැව් විශ්වාස කළේය.

ෆ්‍රේසර් සඳහන් කරන්නේ මානව පරිණාමයේ ආරම්භයේදී ඇති වූ පාරිසරික වෙනස්වීම් හේතු කොට ගෙන මිනිසා අභිචාර කෙරෙහි යොමු වූ බවයි. ප්‍රාථමික මිනිසා තම බුද්ධියට ගෝචර නොවන දේවල්වලට කිසියම් බලයක්, ගෞරවයක් ආරෝපණය කරගත් විශ්වාස පද්ධතියක් තුළින් අභිචාර බිහි වූ බව ඔහු සඳහන් කරයි. (Frazer; 1955; pp 222-223) මේ අනුව අභිචාර ආගම සමග සංයුක්ත වී සමාජ ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන බව පෙනේ. මෙවැනි පසුබිමක් තුළ මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වන්නේ වර්තමාන නාගරික සමාජය තුළ අභිචාර භාවිතයන්ගේ නැඹුරුව කෙබඳුද? යන්න පිළිබඳවයි. එයට අදාළව ගොඩනගාගෙන ඇති උපන්‍යාසය වන්නේ නාගරික සමාජය තුළ තවමත් යම් ප්‍රමාණයකින් අභිචාර භාවිතයන් ශේෂ වී ඇති බවයි. ගම්පහ දිස්ත්‍රික්කයේ තදාසන්න නාගරික ප්‍රදේශ කීපයක පවුල් 100 ක නියැදියක් භාවිත කරමින් සිදු කරන මෙම පර්යේෂණයේ පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සිද්ධි අධ්‍යයන ක්‍රමය භාතා කිරීම සිදු විය. එහිදි දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය යොදා ගැනීම සිදු විය. මානව විද්‍යාත්මක අධ්‍යයනක් වශයෙන් සිදු කරන මෙම පර්යේෂණය මගින් නූතන නාගරික සමාජයේ ජීවත්වන ජනයාගේ අභිචාර භාවිතයන්ගේ නැඹුරුව සහ ඒ ආශ්‍රිත නව ප්‍රවණතා විග්‍රහ කිරීම අපේක්ෂා කෙරේ.

මුඛ්‍ය පද : අභිචාර , නව ප්‍රවණතා , සමාජ ව්‍යුහය , ප්‍රාථමික සමාජය , නාගරික සමාජය

[1] සමාජ විද්‍යා අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. indikarajapaksha86@gmail.com